# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 615/11 — 1990 ජූනි 19 වැනි අඟහරුවාදා — 1990.06.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.—බී. 11/80

### 1980 අංක 26 දරන ආහාර පනත

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වන වගන්තිය යටතේ ආහාර උපදේශක කමිටුව විමසා සෞඛ්‍ය අමාත්‍ය වරයා විසින් සාදන ලද නියෝග.

රේණුකා හේරත් රණවීර,
සෞඛ්‍ය හා වනිතා කටයුතු ඇමතිනී.

1990 ජූනි මස 18 දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 1989 ආහාර (පරිරක්ෂණ) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, 1991 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2. කිසිම තැනැත්තකු විසින්, මෙහි 1 වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිරක්ෂණ ද්‍රව්‍ය හැර වෙනත් යම් ආහාර පරිරක්ෂණ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම හෝ බෙදා හැරීම, භාවිතයට ගැනීම හෝ ප්‍රසිද්ධ කිරීම නොකළ යුතු ය.

3. කිසිදු තැනැත්තකු විසින්, මෙම නියෝගවල විධි විධාන සලස්වා ඇති පරිදි හැර, යම් පරිරක්ෂණ ද්‍රව්‍යයක් අඩංගු යම් ආහාරයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීමට ප්‍රදර්ශනය කිරීම ගබඩා කිරීම හෝ බෙදා හැරීම නොකළ යුතු ය.

4. (මෙහි මින් මතු "නිශ්චිත ආහාර" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහි II වන උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව සඳහන් කර ඇති යම් ආහාරයක (මෙහි මින් මතු "අවසරලත් පරිරක්ෂණ ද්‍රව්‍ය" යනුවෙන් සඳහන් කරනු ලබන) එහි II වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් කර ඇති වර්ගයක පරිරක්ෂණ ද්‍රව්‍ය, එම උපලේඛනයේ III වන තීරුවේ අනුරූප සටහනේ (මෙහි මින් මතු "අවසරලත් ප්‍රමාණය" යනුවෙන් සඳහන් කරනු ලබන) නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රමාණයකින් ඇතුළත් විය හා තිබිය හැකිය.

5. ඕනෑම නිශ්චිත ආහාරයක් සම්බන්ධයෙන් මෙහි II වන උපලේඛනයේ නියම කර ඇති අවසර ලත් පරිරක්ෂණ ද්‍රව්‍ය දෙකක් හෝ ඊට වැඩි ගණනක් එම ආහාරය තුළ හෝ ඒ මත එකී පරිරක්ෂණ ද්‍රව්‍යවල මිශ්‍රණයක් තිබිය හැක්කේ, එම උපලේඛනයට අනුව එකී ආහාරයට යෝග්‍ය උපරිම පරිරක්ෂණ ද්‍රව්‍ය ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් ප්‍රකාශිත වූ අවස්ථාවලදී පමණක් වන අතර, එසේ ප්‍රකාශිත ප්‍රතිශතය එක් සියයකට වැඩි නොවිය යුතු ය.

6. (1) නිශ්චිත ආහාර එකක් හෝ ඊට වැඩි ගණනක් භාවිතා කිරීමෙන් යම් සංයුක්ත ආහාරයක් පිළියෙල කිරීමේ දී යම් අවසර ලත් පරිරක්ෂණ ද්‍රව්‍යයක් ඇතුළත් කරනු ලැබ ඇත් නම්—

(අ) සංයුක්ත ආහාරය සඳහා භාවිතා කරන ලද යම් නිශචිත ආහාරයක මෙම නියෝගය යටතේ ඒ අවසරලත් පරිරක්ෂණ ද්‍රව්‍යය තිබිය හැක්කේ ; සහ

(ආ) භාවිතා කරන ලද නිශ්චිත ආහාරයේ ප්‍රමාණයට අදාළවන ලෙස නොවැඩි ප්‍රමණයකින් ඒ අවසර ලත් පරිරක්ෂණ ද්‍රව්‍යය සංයුක්ත ආහාරයේ තිබෙන්නේ නම්

ඒ සංයුක්ත ආහාරයේ ඒ අවසර ලත් පරිරක්ෂණ ද්‍රව්‍යය තිබීම ඉහත සඳහන් නියෝගයේ කිසිවක් විසින් තහනම් කරනු නොලැබිය යුතු ය. එවිට, ඒ නිශ්චිත ආහාරයට අදාළව නිශ්චිතව සඳහන් කර ඇති අවසර ලත් ප්‍රමාණය II වන උපලේඛනයේ III වන තීරුවේ පරිදි විය යුතු ය.

(2) සංයුක්ත ආහාරය, නිශ්චිත ආහාරයක් නම්, II වන උපලේඛනයේ III වන තීරුවේ නියම කර ඇති සමානුපාතයට වැඩි නොවන සේ II වන උපලේඛනයේ II වන තීරුවේ ඊට අදාළව නිශ්චිතව සඳහන් කර ඇති අවසර ලත් පරිරක්ෂණ ද්‍රව්‍යයක් අඩංගු විය හැකි ය.

7. කිසිදු තැනැත්තකු විසින්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නියම කර ඇති පවිත්‍රතා ප්‍රමිතිවලට අනුකූලවූ ආහාර පරිරක්ෂණ ද්‍රව්‍යයක් හැර, ආහාර සකස් කිරීමේදී ද්‍රව්‍යයක් ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා (යම් වෙනත් ද්‍රව්‍යයක් මිශ්‍රකර ඇති යම් අවසරලත් පරිරක්ෂණ ද්‍රව්‍යයක් ඇතුළුව) වෙනත් යම් අවසරලත් පරිරක්ෂණ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීමට තැබීම, ගබඩා කිරීම හෝ බෙදා හැරීම නොකළ යුතු ය. එවැනි ප්‍රමිති නොමැති වූ විට, ආහාර හා කෘෂිකර්ම සංවිධානය හෝ ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් නියම කර ඇති ප්‍රමිති අදාළ විය යුතු ය.

8. කිසිම තැනැත්තකු විසින් III වන උපලේඛනයේ 1 වන හා 2 වන ඡේදවල නියමයන්ට අනුකූලවූ ලේබලයක් සහිත භාජනයක මිසු ආහාර සකස් කිරීමේදී ද්‍රව්‍යයක් වශයෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා (යම් වෙනත් ද්‍රව්‍යයක් මිශ්‍ර කර ඇති යම් අවසරලත් පරිරක්ෂණ ද්‍රව්‍යයක් ඇතුළුව) යම් අවසරලත් පරිරක්ෂණ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීමට තැබීම, ගබඩා කිරීම හෝ බෙදා හැරීම නොකළ යුතු ය.

9. මෙම නියෝගවල නියම කර ඇති අවසරලත් පරිරක්ෂණ ද්‍රව්‍ය එකතු කර ඇති සෑම ආහාර අසුරණයකම හෝ බහාලුවකම 1986 ආහාර (විවිධ) නියෝගවලින් අවශ්‍ය කරන ප්‍රකාශනයක් තිබිය යුතු ය.

10. පටහැනි අදහසක් ප්‍රකාශ වුවහොත් මිස, මෙම නියෝගවල සඳහන් සියලු සමානුපාත, නිෂ්පාදිත ද්‍රව්‍යයේ බර අනුව ගණන් බලා ඇති සමානුපාත, විය යුතු ය.

11. මෙම නියෝගවල "පරිරක්ෂණ ද්‍රව්‍ය" යන්නෙන් ආහාරයට එකතු කිරීම නිසා, ආහාර පැසවීමේ, ආම්ලීභවනයවීමේ හෝ වෙනත් වියෝජනයක් වීමේ ක්‍රියාවලිය නිශේධනය කිරීමට, මර්ධනය කිරීමට හෝ ආසේධ කිරීමට හැකි ද්‍රව්‍යයක් අදහස් වන අතර පහත සඳහන් ද්‍රව්‍ය ඊට ඇතුළත් නොවේ:—

(අ) අවසර ලත් ඕනෑම ප්‍රති ඔක්සිකාරකයක්
(ආ) අවසර ලත් ඕනෑම කෘත්‍රිම රසකාරයක්
(ඇ) අවසර ලත් ඕනෑම විරංජකයක්
(ඈ) අවසරලත් ඕනෑම වර්ණක ද්‍රව්‍යයක්
(ඉ) අවසර ලත් ඕනෑම තෙලෝදයක්
(ඊ) අවසර ලත් ඕනෑම ආහාර අභිවර්ධකයක්
(උ) අවසර ලත් ඕනෑම සංකීර්ණ ආකලනයක්
(ඌ) අවසර ලත් ඕනෑම ද්‍රාවකයක්
(එ) අවසර ලත් ඕනෑම ස්ථායි කාරකයක්
(ඒ) විනාකිරි
(ඔ) ඕනෑම ද්‍රාවරන, පිෂ්ඨධාතු රසකාරකයක්
(ඕ) බීමට ගන්නා ස්ප්‍රීතු හෝ වයින්
(ක) රස කිරීමට යොදාගන්නා පැළෑටි, කුළුබඩු, බීර මල් සාරය හෝ රස කරන සාරය
(ග) සාමාන්‍ය ලුණු (සෝඩියම් ක්ලෝරයිඩ්)
(ජ) දුම්ගැස්වීමෙන් සකස් කිරීමේ ක්‍රියාවලිය මාර්ගයෙන් ආහාරයට එකතු කරන ඕනෑම ද්‍රව්‍යයක්.

I වන උපලේඛනය

අවසර ලත් ආහාර පරිරක්ෂණ ද්‍රව්‍ය

| I වන තීරුව | II වන තීරුව |
|---|---|
| 2 වැනි උප ලේඛනයේ නියමිත කර ඇති අවසර ලත් ආහාර පරිරක්ෂණ ද්‍රව්‍ය | අවසර ලත් ආහාර පරිරක්ෂණ ද්‍රව්‍ය උපයෝගී කරගත හැකි විකල්ප ක්‍රම (1 වැනි තීරුවෙහි දක්වා ඇති අවසර ලත් ආහාර පරිරක්ෂණ ද්‍රව්‍ය පරිදි ගණන් බැළිය යුතුයි.) |
| 1. බෙන්සොයික් ඇසිඩ් ... | ... සෝඩියම් බෙන්සොඒට්<br>පොටෑසියම් බෙන්සොඒට්<br>කැල්සියම් බෙන්සොඒට් |
| 2. මිතයිල් 4 හයිඩරොක්සි බෙන්සොඒට් | ... මීතයිල් 4 හයිඩරොක්සි බෙන්සොඒට් සෝඩියම් ලුණු |
| 3. ඉතයිල් 4 හයිඩරොක්සි බෙන්සොඒට් | ... ඊතයිල් 4 හයිඩරොක්සි බෙන්සොඒට්<br>සෝඩියම් ලුණු |
| 4. ප්‍රොපයිල් 4 හයිඩරොක්සි බෙන්සොඒට් | ... ප්‍රොපයිල් 4 හයිඩරොක්සි බෙන්සොඒට්<br>සෝඩියම් ලුණු |
| 5. සෝඩියම් නයිට්‍රේට ... | ... පොටෑසියම් නයිට්‍රේට් |
| 6. සෝඩියම් නයිට්‍රයිට ... | ... පොටෑසියම් නයිට්‍රයිට් |
| 7. ප්‍රොපියෝනික් ඇසිඩ් ... | ... සෝඩියම් ප්‍රොපියනේට්<br>කැල්සියම් ප්‍රොපියනේට් |
| 8. සෝබික් ඇසිඩ් ... | ... සෝඩියම් සොර්බේට්<br>පොටෑසියම් සොර්බේට්<br>කැල්සියම් සොර්බේට් |
| 9. සල්පර් ඩයොක්සයිඩ් ... | ... සෝඩියම් සල්පයිට්<br>සෝඩියම් හයිඩ්‍රොජන් සල්පයිට්<br>සෝඩියම් මෙටාබයිසල්පයිට්<br>පොටෑසියම් මෙටාබයිසල්පයිට්<br>කැල්සියම් සල්පයිට්<br>කැල්සියම් හයිඩ්‍රොජන් සල්පයිට් |

10. බයිපිනයිල්
11. 2 හයිඩ්‍රොක්සි බයිපිනයිල්
12. 2 (තයසොල් 4 – වයි 1) බෙන්සිම්ඩසෝල්
13. හෙක්සාමීයින්
14. නයිසින්

## II වන උපලේඛනය

අවසර ලත් ආහාර පරිරක්ෂණ ද්‍රව්‍ය අඩංගු විය හැකි ආහාර ද්‍රව්‍ය සහ ඒ ඒ ආහාරයේ අඩංගු පරිරක්ෂණ ද්‍රව්‍යයේ ස්වභාවය හා ප්‍රමාණය

| I වන තීරුව<br>නියමිත ආහාර | II වන තීරුව<br>අවසර ලත් ආහාර පරිරක්ෂණ ද්‍රව්‍ය | III වන තීරුව<br>අවසරලත් ප්‍රමාණය (වෙනත් ආකාරයකට දක්වා ඇත්නම් මිස කිලෝ ග්‍රෑමයකට මිලිග්‍රෑම් මෙහි දක්වා ඇති ප්‍රමාණයට වැඩි නොවන සේ) |
|---|---|---|
| කිරි ... ... ... ... | සල්පර් ඩයොක්සයිඩ් සහ ඊතර් ... ... | 70 |
| | බෙන්සොයික් ඇසිට් හෝ ... ... ... | 70 |
| | මිතයිල් 4 හයිඩොක්සි බෙන්සොඒට් හෝ ... ... | 70 |
| | ඊතයිල් 4 හයිඩොක්සි බෙන්සොඒට් හෝ ... ... | 70 |
| | ප්‍රොපයිල් 4 හයිඩොක්සි බෙන්සොඒට් ... ... | 70 |
| පාන් ... ... ... ... | ප්‍රොපියොනික් ඇසිඩ් ... ... ... | 3000 (පිටිවල බර අනුව ගණන් බලා ඇත.) |
| කැන්ඩි පිල් හෝ (පැණිවල දමා) කපා පෙරාගත් ලෙලි වර්ග | සල්පර් ඩයොක්සයිඩ් හෝ ... ... ... | 100 |
| | සෝබික් ඇසිඩ් ... ... ... | 1000 |
| කේජු ... ... ... ... | සෝබික් ඇසිඩ් ... ... ... | 1000 |
| කේජු චෙෂයර් හැර ... ... ... | සෝඩියම් නයිට්‍රේට් හෝ ... ... ... | 100 |
| චෙෂයර්, ග්‍රානාපඩානෝ හෝ නොවන ප්‍රොවොලෝන් වර්ග හෝ මෘදු කේජු | සෝඩියම් නයිට්‍රයිට් ... ... ... | 10 |
| නත්තල් පුඩිම ... ... ... | ප්‍රොපියොනික් ඇසිට් ... ... ... | 1000 |
| සයිඩර් ... ... ... | සල්පර් ඩයොක්සයිඩ් හෝ ... ... ... | 200 |
| | සෝබික් ඇසිඩ් ... ... ... | 200 |
| පොල්, කපාපු ... ... ... | සල්පර් ඩයොක්සයිඩ් ... ... ... | 50 |
| කෝපි, සාරය, ඝන ... ... ... | සල්පර් ඩයොක්සයිඩ් ... ... ... | 150 |
| අවසරලත් වර්ණක ද්‍රව්‍ය ... ... ... | බෙන්සොයික් ඇසිඩ් හෝ ... ... | 2000 |
| කැරමල් හැර අනුමත වර්ණක ද්‍රව්‍ය හෝ දියරයක ආකාරයට වූ කැරමල් හැර අවසර ලත් වර්ණක ද්‍රව්‍ය | මිතයිල් 4 – හයිඩ්‍රොක්සි බෙන්සොඒට් හෝ ... ... | 2000 |
| | ඊතයිල් 4 – හයිඩ්‍රොක්සි බෙන්සොඒට් හෝ ... ... | 2000 |
| | ප්‍රොපයිල් 4 – හයිඩ්‍රොක්සි බෙන්සොඒට් හෝ ... | 2000 |
| | සෝබික් ඇසිට් ... ... ... | 1000 |
| කැරමල් ... ... ... | සල්පර්ඩයොක්සයිඩ් හෝ ... ... ... | 1000 |
| ඩයිමිතයිල් පොලිසිලොක්සේන් ... ... | සල්පර් ඩයොක්සයිඩ් හෝ ... ... ... | 1000 |
| | බෙන්සොයික් ඇසිඩ් හෝ ... ... ... | 2000 |
| | මිතයිල් 4 – හයිඩ්‍රොක්සි බෙන්සොඒට් හෝ ... | 2000 |
| | ඊතයිල් 4 – හයිඩ්‍රොක්සි බෙන්සොඒට් හෝ ... ... | 2000 |
| | ප්‍රොපයිල් 4 – හයිඩ්‍රොක්සි බෙන්සොඒට් හෝ ... | 2000 |
| | සොබික් ඇසිඩ් ... ... ... | 1000 |
| පිනින්ස්, සිල්ලරට විකිණීම : | | |
| වයින් පිනින්ස් ... ... ... | සල්පර් ඩයොක්සයිඩ් ... ... ... | 12500 |
| බියර් පිනින්ස් ... ... ... | සල්පර් ඩයොක්සයිඩ් හෝ ... ... ... | 50000 |
| රසකාරක ... ... ... | සල්පර් ඩයොක්සයිඩ් හෝ ... ... | 350 |
| | බෙන්සොයික් ඇසිඩ් හෝ ... ... ... | 800 |
| | මිතයිල් 4 – හයිඩ්‍රොක්සි බෙන්සොඒට් හෝ ... | 800 |
| | ඊතයිල් 4 – හයිඩ්‍රොක්සි බෙන්සොඒට් හෝ ... ... | 800 |
| | ප්‍රොපයිල් 4 – හයිඩ්‍රොක්සි බෙන්සොඒට් හෝ ... | 800 |
| රස කරන පැණි (සිරප්) ... ... ... | සල්පර් ඩයොක්සයිඩ් හෝ ... ... ... | 350 |
| | බෙන්සොයික් ඇසිඩ් හෝ ... ... ... | 800 |
| | මිතයිල් 4 – හයිඩ්‍රොක්සි බෙන්සොඒට් හෝ ... ... | 800 |
| | ඊතයිල් 4 – හයිඩ්‍රොක්සි බෙන්සොඒට් හෝ ... ... | 800 |
| | ප්‍රොපයිල් 4 – හයිඩ්‍රොක්සි බෙන්සොඒට් ... ... | 800 |
| පිටි රසකැවිලි ... ... ... | ප්‍රොපියොනික් ඇසිඩ් හෝ ... ... ... | 1000 |
| | සෝබික් ඇසිඩ් ... ... ... | 1000 |

| I වන තීරුව<br>නියමිත ආහාර | II වන තීරුව<br>අවසර ලත් ආහාර පරිරක්ෂණ ද්‍රව්‍ය | III වන තීරුව<br>අවසරලත් ප්‍රමාණය (වෙනත් ආකාරයකට දක්වා ඇත්නම් මිස කිලෝ ග්‍රෑමයකට මිලිග්‍රෑම් මෙහි දක්වා ඇති ප්‍රමාණයට වැඩි නොවන සේ) |
|---|---|---|
| පෙරන ශීර්ෂ දියර | සල්පර් ඩයොක්සයිඩ් හෝ | 5000 |
| | බෙන්සොයික් ඇසිට් හෝ | 10000 |
| | මීතයිල් 4 – හයිඩ්‍රොක්සි බෙන්සොඒට් හෝ | 10000 |
| | ඊතයිල් 4 – හයිඩ්‍රොක්සි බෙන්සොඒට් හෝ | 10000 |
| | ප්‍රොපයිල් 4 – හයිඩ්‍රොක්සි බෙන්සොඒට් | 10000 |
| අධි ශීතකළ බීම | සල්පර් ඩයොක්සයිඩ් හෝ | 70 |
| | බොන්සොයින් ඇසිඩ් හෝ | 160 |
| | මීතයිල් 4 — හයිඩොක්සි බෙන්සොඑට් හෝ | 160 |
| | ඊතයිල් 4 — හයිඩොක්සි බෙන්සොඑට් හෝ | 160 |
| | ප්‍රොපයිල් 4 — හයිඩොක්සි බෙන්සෝඒට් හෝ | 160 |
| | සෝබික් ඇසිඩ් | 50 |
| පළතුරු ස්පටික හෝ ග්ලේෂ් | සල්පර් ඩයොක්සයිඩ් හෝ | 100 |
| | බෙන්සොයික් ඇසිඩ් හෝ | 1000 |
| | මීතයිල් 4 — හයිඩොක්සි බෙන්සොඒට් හෝ | 1000 |
| | ඊතයිල් 4 — හයිඩොක්සි බෙන්සොඒට් හෝ | 1000 |
| | ප්‍රොපයිල් 4 — හයිඩොක්සි බෙන්සොඒට් හෝ | 1000 |
| | සෝබින් ඇසිඩ් | 1000 |
| ප්‍රෑන්ස් හැර වියළී කළ පළතුරු, | සල්පර් ඩයොක්ඝයිඩ් හෝ | 2000 |
| අළුත් පළතුරු : | | |
| කෙසෙල් | 2 — (තයසෝල් 4 — වයිඑල්) බෙන්සිම්ඩසෝල් | 3 |
| පැහිරි පළතුරු | බයිෆේපනිල් හෝ | 70 |
| | 2 — හයිඩොක්සි බයිෆේපනිල් හෝ | 12 |
| | 2 — (තයිසෝල් — 4 වයිඑල්) බෙන්සිම්ඩසෝල් | 20 |
| මිදි | සල්පර් ඩයොක්සයිඩ් | 15 |
| පැණිරස කළ හෝ පැණිරස නොකළ පළතුරු යුෂ සාන්ද්‍ර | | 350 |
| කර ඇත්ද, නැද්ද | බෙන්සොයින් ඇසිඩ් හෝ | 800 |
| | මීතයිල් 4 — හයිඩොක්සි බෙන්සොඒට් | 800 |
| | ඊතයිල් 4 — හයිඩොක්සි බෙන්සොඒට් | 800 |
| | ප්‍රොපයිල් 4 — හයිඩොක්සි බෙන්සොඒට් | 800 |
| තක්කාලි පල්ප්, පේස්ට් හෝ පූරි ඇතුළු ටින් කළ හෝ අළුත් නොවන පළතුරු හෝ පල්ප් | සල්පර් ඩයොක්සයිඩ් හෝ | 350 |
| | බෙන්සොඒච් ඇසිඩ් ගෝ | 2000 |
| | මීතයිල් 4 — හයිඩොක්සි බෙන්සොඒට් හෝ | 800 |
| | ඊතයිල් 4 — හයිඩොක්සි බෙන්සොඒට් | 800 |
| | ප්‍රොපයිල් 4 — හයිඩොක්සි බෙන්සොඒට් හෝ | 800 |
| සුදුළුණු කුඩු | සල්පර් ඩයොක්සයිඩ් | 2000 |
| ජෙලටින් | සල්පර් ඩයොක්සයිඩ් | 1000 |
| ඉඟුරු වියලි මුල් | සල්පර් ඩයොක්සයිඩ් | 150 |
| මිදි යුෂ නිෂ්පාදන (ආගමික වතාවත් සඳහා නොපැසුණු) | සල්පර් ඩයොක්සයිඩ් සහ | 70 |
| | බෙන්සොයින් ඇසිඩ් හෝ | 2000 |
| | මීතයිල් 4 — හයිඩොක්සි බෙන්සොඒට් හෝ | 2000 |
| | ඊතයිල් 4 — හයිඩොක්සි බෙන්සොඒට් | 2000 |
| | ප්‍රොපයිල් 4 — හයිඩොක්සි බෙන්සොඒට් | 2000 |
| මිදි යුෂ සාන්ද්‍ර කරන ලද ගෙවල්වල වයින් සෑදීමට පාවිච්චි කරන සහ ඒ පරිදි ලේබල් ගැසූ හැම්බර්ගර් හෝ සමාන නිෂ්පාදන | සල්පර් ඩයොක්සයිඩ් | 2000 |
| සිල්ලරට වෙළඳම් කළ වියලි හොප්ස් | සල්පර් ඩයොක්සයිඩ් | 450 |
| | බෙන්සොඒච් ඇසිඩ් ගෝ | 800 |
| ජෑම් | අවශිෂය සල්පර් ඩයොක්සයිඩ් දක්වා | 100 |
| ජෑම් දියවැඩියා රෝග | සල්පර් ඩයොක්සයිඩ් හෝ | 100 |
| | බෙන්සොයික් ඇසිඩ් හෝ | 500 |
| | මීතයිල් 4 — හයිඩොක්සි බෙන්සොඒට් හෝ | 500 |
| | ඊතයිල් 4 — හයිඩොක්සි බෙන්සොඒට් හෝ | 500 |
| | ප්‍රොපයිල් 4 — හයිඩොක්සි බෙන්සොඒට් | 500 |
| මස් : | | |
| (අ) සකස් කළ මස් (සකස් කළ මාංශ නිෂ්පාදන ඇතුළුව) | සෝඩියම් නයිට්‍රේඩ් | 500 |
| නිර්ජීවානු ඇසුරුමෙන් පිටතට ගෙන ඇති, හෝ නැති | සෝඩියම් නයිට්‍රයිඩ් | 200 |

| I වන තීරුව | II වන තීරුව | III වන තීරුව |
|---|---|---|
| නියමිත ආහාර | අවසර ලත් ආහාර පරිසංරක්ෂණ ද්‍රව්‍ය | අවසරලත් ප්‍රමාණය (වෙනත් ආකාරයකට දක්වා ඇත්නම් මිස කිලෝ ග්‍රෑමයකට මිලිග්‍රෑම් මෙහි දක්වා ඇති ප්‍රමාණයට වැඩි නොවනසේ |
| (ආ) වායු රෝගික බහාලුනුවක නොවන හා එවැන්නක අහුරා නොමැති නොපිසන ලද බේකන් හා හැම් පිසන ලද බේකන් හා හැම් | සෝඩියම් සයිට්‍රේට් | 500 |
| | සෝඩියම් නයිට්‍රයිට් | 300 |
| (ඇ) ඉහත නියම කර නොමැති ඕනෑම සකස් කළ මාංශ හෝ සකස් කළ මාංශ නිෂ්පාදිත | සෝඩියම් නයිට්‍රේට් | 200 |
| | සෝඩියම් නයිට්‍රයිඩ් | |
| පෙක්ටින් දියර | සල්පර් ඩයොක්සයිඩ් | 250 |
| පෙරි | සල්පර් ඩයොක්සයිඩ් හෝ | 200 |
| | සෝබික් ඇසිඩ් | 200 |
| අච්චාරු | සල්පර් ඩයොක්සයිඩ් හෝ | 100 |
| | බෙන්සොයික් ඇසිඩ් හෝ | 250 |
| | මීතයිල් 4– හයිඩොක්සි බෙන්සොඒට් | 250 |
| | ඊතයිල් 4– හයිඩොක්සි බෙන්සොඒට් | 250 |
| | ප්‍රොපයිල් 4 – හයිඩොක්සි බෙන්සොඒට් හෝ | 250 |
| | සෝබික් ඇසිඩ් | 100 |
| ජෑන්ස් | සෝබික් ඇසිට් හෝ | 1000 |
| | සල්පර් ඩයොක්සයිඩ් | 2000 |
| රෙනට්, දියර | බෙන්සොයික් ඇසිඩ් හෝ | 2000 |
| | මීතයිල් 4 – හයිඩොක්සි බෙන්සොඒට් හෝ | 2000 |
| | ඊතයිල් 4 – හයිඩොක්සි බෙන්සොඒට් හෝ | 2000 |
| | ප්‍රොපයිල් 4 – හයිඩොක්සි බෙන්සොඒට් | 2000 |
| සෝස් වර්ග | සල්පර් ඩයොක්සයිඩ් හෝ | 100 |
| | බෙන්සොයික් ඇසිඩ් හෝ | 250 |
| | මීතයිල් 4 – හයිඩොක්සි බෙන්සොඒට් හෝ | 250 |
| | ඊතයිල් 4 – හයිඩොක්සි බෙන්සොඒට් හෝ | 250 |
| | ප්‍රොපයිල් 4 – හයිඩොක්සි බෙන්සොඒට් හෝ | 250 |
| | සෝබික් ඇසිඩ් හෝ මේවායේ මිශ්‍රණයක් | 1000 |
| සොසේජස් හෝ සොසේජ්, මස් | සල්පර් ඩයොක්සයිඩ් | 450 |
| පරිභෝජනය සඳහා සිසිල් බීම | සල්පර් ඩයොක්සයිඩ් හෝ | 350 |
| මෙම උප ලේඛනයන් නිශ්චය කර නොමැති ජල මිශ්‍රණයට පසු | බෙන්සොයික් ඇසිඩ් හෝ | 800 |
| | මීතයිල් 4 – හයිඩොක්සි බෙන්සොඒට් | 800 |
| | ඊතයිල් 4 – හයිඩොක්සි බෙන්සොඒට් | 800 |
| | ප්‍රොපයිල් 4 – හයිඩොක්සි බෙන්සොඒට් | 800 |
| | සෝබික් ඇසිඩ් හෝ මේවායේ මිශ්‍රණයක් | 1500 |
| පරිභෝජනය සඳහා සිසිල් බීම | සල්පර් ඩයොක්සයිඩ් හෝ | 70 |
| මෙම උප ලේඛණයේ නිශ්චය කර නොමැති ජල මිශ්‍රණය රහිතව | බෙන්සොයික් ඇසිඩ් හෝ | 160 |
| | මීතයිල් 4 – හයිඩොක්සි බෙන්සොඒට් | 160 |
| | ඊතයිල් 4 – හයිඩොක්සි බෙන්සොඒට් | 160 |
| | ප්‍රොපයිල් 4 – හයිඩොක්සි බෙන්සොඒට් | 160 |
| | සෝබික් ඇසිඩ් හෝ මේවායේ මිශ්‍රණයක් | 300 |
| පිෂ්ඨ හා වෙනස් කළ පිෂ්ඨ ඇතුළු | සල්පර් ඩයොක්සයිඩ් | 100 |
| ශර්කරා: | | |
| ග්ලූකෝස් පැණිය හා දියර සමගම හෝ වෙනත් ජලය විච්ඡේදනය කළ පිෂ්ඨ. වියලි ග්ලූකෝස් පැණි හා ඝන ස්වභාවයෙන් වෙනස් කළ පිෂ්ඨ | සල්පර් ඩයොක්සයිඩ් | 450 |
| ලැක්ටෝස් හැර වෙනත් ශර්කරා | සල්පර් ඩයොක්සයිඩ් | 70 |
| විනාකිරි | සල්පර් ඩයොක්සයිඩ් හෝ | 200 |
| | සෝබික් ඇසිඩ් | 200 |
| | සල්පර් ඩයොක් සයිඩ් ඇසිඩ් | 70 |
| වයින් | සල්පර් ඩයොක්සයිඩ් හෝ | 450 |
| | සෝබික් ඇසිඩ් | 450 |

| I වන තීරුව<br>නියමිත ආහාර | II වන තීරුව<br>අවසර ලත් ආහාර පරිරක්ෂණ ද්‍රව්‍ය | III වන තීරුව<br>අවසරලත් ප්‍රමාණය (වෙනත් ආකාරයකට දක්වා ඇත්නම් මිස කිලෝ ග්‍රෑමයකට මිලිග්‍රෑම් වෙහි දක්වා ඇති ප්‍රමාණයට වැඩි නොවන සේ) |
|---|---|---|
| යෝගට් ... ... ... | සෝබික් ඇසිඩ් හෝ ... ... ... | 300 |
| | සල්පර් ඩයොක්සයිඩ් හෝ ... ... ... | 60 |
| | බෙන්සොයික් ඇසිඩ් හෝ ... ... ... | 120 |
| | මීතයිල් 4—හයිඩොක්සි බෙන්සොඒට් හෝ ... ... | 120 |
| | ඊතයිල් 4—හයිඩොක්සි බෙන්සොඒට් හෝ ... ... | 120 |
| | ප්‍රොපයිල් 4—හයිඩොක්සි බෙන්සොඒට් ... ... | 120 |
| මුදවාපු කිරි ... ... ... | සෝබික් ඇසිඩ් ... ... ... | 300 |

### III වන උපලේඛනය

1. (1) 9 වැනි නියෝගය අදාල වන එක් එක් බහලනුවක් ලේබලයක් සහිත විය යුතු අතර, එම ලේබලයේ සත්‍ය ප්‍රකාශනයක් මුද්‍රණය කර තිබිය යුතුය.

(අ) ආහාරයක අඩංගු අවසර ලත් ඒ ඒ පරිරක්ෂණ ද්‍රව්‍යයේ පොදු හෝ සාමාන්‍ය නම හෝ එවැනි එක් එක් ද්‍රව්‍යයක උචිත නාමය.

(ආ) වෙනත් ඕනෑම ද්‍රව්‍යයක් අඩංගු වූ හෝ අඩංගුව ඇති විට පොදු හෝ සාමාන්‍ය නම හෝ එක් එක් ද්‍රව්‍යයේ උචිත නාමය.

(ඇ) එවැනි ද්‍රව්‍ය දෙකක් හෝ ඊට වැඩි ගණනක් ඇතුළත් නම්, ඒ ඒ අවසර ලත් පරිරක්ෂණ ද්‍රව්‍යයේ සහ වෙනත් ද්‍රව්‍යයේ සමානුපාතික ප්‍රමාණය

2. 1 වෙනි ඡෙදයෙන් අවශ්‍ය කරන ඕනෑම ප්‍රකාශනයක්—

(අ) පැහැදිලි හා කියවීමට හැකි විය යුතුයි.

(ආ) බහාලනුවේ ලකුණු කර ඇති හෝ සුරක්ෂිතව යාකර ඇති ලේබලයේ ප්‍රකට ස්ථානයක විය යුතු අතර ආහාර මිළට ගැනීමේ සාමාන්‍ය තත්ත්වය යටතේ බඩු මිළට ගැනීමේ අදහස වූ අයකු විසින් පහසුවෙන් තේරුම් ගතහැකි සහ අනායාසයෙන් කියවියහැකි ආකාරයට ද විය යුතුයි.

(ඇ) වෙනත් ඕනෑම ආකාරයකින් සැඟවී හෝ නොපැහැදිලිව හෝ දර්ශනය වීම අඩුකිරීම හෝ නොකළ යුතුය.

6–34/1

---

### 1980 අංක 26 දරන ආහාර පනත

1980 අංක 26 දරන ආහාර පනතේ 17 වන වගන්තිය සමග කියවිය යුතු 32 වන වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රේණුකා හේරත් රණවීර,
සෞඛ්‍ය හා වනිතා කටයුතු ඇමතිනී.

1990 ජූනි මස 18 දින,
කොළඹ දීය.

#### නියෝග

1985 ජූනි මස 7 වන දින අංක 353 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1984 ආහාර පනතේ (අතිරේක අනුමත විශ්ලේෂක) නියෝගවල 2 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන අලුත් නියෝගය ආදේශ කිරීමෙන් එම නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"2. යම් තැනැත්තකුට, පහත දැක්වෙන සුදුසුකම්, එනම්,

(1) (අ) රසායන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය හෝ;

(ආ) මේ ඡේදයේ (අ) අනු ඡේදයේ නිශ්චිතව දැක්වෙන සුදුසුකමට සමාන, එනම් ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ සාමාජිකත්වය වැනි සුදුසුකමක්

සමග ආහාර විශ්ලේෂණය පිළිබඳව සුදුසුකම් ලැබීමෙන් පසුව ලැබූ අවුරුදු තුනක පළපුරුද්ද ; හෝ

(2) (අ) ආහාර විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ; හෝ

(ආ) මේ ඡේදයේ (අ) අනුඡේදයේ නිශ්චිතව දැක්වෙන සුදුසුකමට සමාන සුදුසුකමක් සමග ආහාර විශ්ලේෂණය පිළිබඳව සුදුසුකම් ලැබීමෙන් පසුව ලත් අවුරුදු දෙකක පළපුරුද්ද

ඇත්නම් මිස ආහාර පිළිබඳ රසායන විශ්ලේෂණ කටයුතු පවත්වාගෙන යාමේ කාර්ය සඳහා, ඒ තැනැත්තා අතිරේක අනුමත විශ්ලේෂකයකු ලෙස අනුමත කරනු නොලැබිය යුතු ය.

3. යම් තැනැත්තකුට පහත දැක්වෙන සුදුසුකම්, එනම් :—

(අ) බැක්ටීරිවේදය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් සමග වෛද්‍ය විද්‍යාව පිළිබඳ මූලික උපාධියක් ; හෝ

(ආ) ක්ෂුද්‍ර ජීවි විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් සමග රසායන විද්‍යා උපාධියක් (ශාස්ත්‍රවේදී) ඇත්නම් මිස, ක්ෂුද්‍ර ජීව විද්‍යා විශ්ලේෂණ කටයුතු පවත්වාගෙන යාමේ කාර්ය සඳහා, ඒ තැනැත්තා අතිරේක අනුමත විශ්ලේෂකයකු ලෙස අනුමත කරනු නොලැබිය යුතු ය.".

1985 ජූනි මස 7 වන දින අංක 353 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1984 ආහාර පනතේ (අතිරේක අනුමත විශ්ලේෂක) නියෝග සහ ඉහත දැක්වෙන නියෝගය ඇතුළුව ඉහත සඳහන් සංශෝධන 1990 ඔක්තෝබර් මස 1 දා සිට ක්‍රියාත්මක විය යුතු ය.

6-34/2

එල්. ඩී.—බී 11/80

## 1980 අංක 26 දරන ආහාර පනත

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වන වගන්තිය යටතේ ආහාර උපදේශක කමිටුව විමසීමෙන් පසු සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රේණුකා හේරත් රණවීර,
සෞඛ්‍ය හා වනිතා කටයුතු ඇමතිනී.

1990 ජූනි මස 18 දින,
කොළඹ දී ය.

### නියෝග

1985 ජූනි 7 වන දින අංක 353 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1984 ආහාර පනත් (විවිධ) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 2 වන නියෝගයෙහි—

(අ) (1) වන ඡේදයේ ඇති "යම් බලපත්‍රයක කොන්දේසි" යන වචන වෙනුවට "යම් ලියාපදිංචි කිරීමක ඇති කොන්දේසි" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) (2) වන ඡේදයෙහි ඇති "පිළිබඳ ඔහු වෙත ලිය විල්ලකින් කරන ලද" යන වචන වෙනුවට "පිළිබඳව ඔහු වෙත කරන ලද" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි 3 වන නියෝගයෙහි—

(අ) (2) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(2) බලයලත් නිලධරයාගේ මතය අනුව, සාම්පලය වශයෙන් ලබාගත් ප්‍රමාණය කොටස් වලට බෙදීම හේතු කොටගෙන විශ්ලේෂනය හෝ පරීක්ෂණය ප්‍රායෝගික නො වන තත්ත්වයට හෝ සිදු කළ නොහැකි තත්ත්වයට පත් නොවන්නේ නම්, ඔහු විසින්

(අ) සාම්පලය කොටස් තුනකට බෙදිය යුතු ය ;

(ආ) එම කොටස් තුන, අයිතිකරුගේ කොටස, සාම්පලය සහ අනු සාම්පලය වශයෙන් හඳුනා ගත හැකි පරිදි නම් කළ යුතු ය. නිෂ්පාදකයා විසින් ආහාර ද්‍රව්‍යය මත අලවන ලද ලේබලයේ කොටසක් එකී එක් කොටසක ඇති අවස්ථාවක දී බලය ලත් නිලධරයා විසින් එම කොටස සාම්පලය ලෙස නම් කළ යුතු ය ;

(ඇ) අයිතිකරුට හෝ සාම්පලය ලබා ගත්තේ යම් තැනැත්තකුගෙන් ද එම තැනැත්තාට කොටස් තුන ම මත තම මුද්‍රාව තැබීමට හෝ අත්සන තැබීමට හෝ මාපට ඇඟිලි සලකුණ තැබීමට හෝ අවසර දෙනු ලැබිය යුතු ය ;

(ඈ) මුද්‍රා කැඞීමෙන් හෝ ඒවාට හානි කිරීමෙන් තොරව විවෘත කරනු ලැබිය නොහැකි ආකාරයට, ඒ එක් එක් කොටස සුරක්ෂිත කරනු ලැබිය යුතු ය.

(ඉ) අයිතිකරුගේ කොටස වශයෙන් නම් කරන ලද කොටස අයිතිකරුට හෝ සාම්පලය ලබා ගන්නා ලද්දේ යම් තැනැත්තකුගෙන් ද එම තැනැත්තාට භාර දිය යුතු අතර සාම්පලය වශයෙන් නම් කරන ලද කොටස, මෙහි උපලේඛනයෙහි දක්වා ඇති අංක 1 දරන ආකෘති පත්‍රයෙහි සාරනු ලැබූ සටහනක් සමග විශ්ලේෂනය හෝ පරීක්ෂණය සඳහා අනු මත විශ්ලේෂකවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ; තව ද

(ඊ) අයිතිකරුට හෝ සාම්පලය ලබාගන්නා ලද්දේ යම් තැනැත්තකුගෙන් ද එම තැනැත්තාට විරුද්ධව නඩු පවරනු ලැබුවහොත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා අනුසාම්පලය වශයෙන් නම් කරන ලද කොටස ආරක්ෂා සහිතව තබා ගත යුතු ය.".

(උ) එම නියෝගයේ (3) වන ඡේදයේ ඇති "සුදුසු පරිදි ලේබල් ගසා අයිතිකරුට නියම කළ යුතු ය" යන වචන වෙනුවට "සුදුසු පරිදි" ලේබල් ගසා අයිතිකරුට අවසර දිය යුතු ය" යන්න ආදේශ කිරීමෙන් ;

(ඌ) එම නියෝගයේ (5) වන ඡේදය, එම නියෝගයේ 5(අ) වන ඡේදය වශයෙන් නැවත අංක යෙදීමෙන් ;

(එ) එම නියෝගයේ අලුතින් අංක යෝදන ලද 5(අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්

"5(ආ). පරීක්ෂණය හෝ විශ්ලේෂණය සඳහා ආහාරයේ සාම්පලයක් ලබා ගන්නා බලය ලත් නිලධරයකු විසින් එම ආහාරයේ වෙළඳ වටිනාකම එය විකුණන්නා ට ගෙවිය යුතු ය."

(3) එහි 4 වන නියෝගයේ—

(1) (4) වන ඡේදයේ ඇති, "සලකුණ තබන ලෙස" යන වචනවල සිට එම ඡේදයේ අවසානය දක්වා ඇති වචන වෙනුවට "සලකුණ තැබීමට අයිතිකරුට හෝ සාම්පලය ලබාගත්තේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තාට ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණය සඳහා සාම්පලයක් ලබාගත් බලයලත් නිලධරයා අවසර දිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(2) (7) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(8) ක්ෂුද්‍ර ජෛවවේදීය විශ්ලේෂණය සඳහා ආහාර සාම්පලයක් ලබාගන්නා බලය ලත් නිලධරයකු විසින් එම ආහාරයේ වෙළඳ වටිනාකම විකුණන්නාට ගෙවිය යුතු ය."

(4) එහි 5 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :—

"5. ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සෑම ආහාර ද්‍රව්‍යයක් ම, ඒ ආහාර ද්‍රව්‍යයේ සංයුතිය, පරිශුද්ධතාවය සහ තත්ත්වය පිළිබඳව අමාත්‍යවරයා විසින් කලින් කල අනුමත කරනු ලැබූ ප්‍රමිතිවලට අනුකූල විය යුතු ය."

(5) එහි 6 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් ;—

"6. (1) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලද යම් ආහාර ද්‍රව්‍යයක සාම්පලයක් බලයලත් නිලධරයකු විසින් කරනු ලැබූ පරීක්ෂාවක දී හෝ අනුමත කළ විශ්ලේෂකයකු විසින් කරනු ලැබූ විශ්ලේෂණයක දී නැතහොත් පරීක්ෂාවක දී, ඒ ආහාර ද්‍රව්‍යයට අදාළ අනුමත ප්‍රමිතිවලට ඒ සාම්පලය අනුකූල නොවන බවත් ඒ ආහාර ද්‍රව්‍යය ශ්‍රී ලංකාවෙහි විකිණීමෙන් පනතේ විධිවිධාන හෝ පනත යටතේ සාදන ලද යම් නියෝගවල විධිවිධාන උල්ලංඝනය වන බවත් සොයා ගන්නට ලැබුණහොත්, අවස්ථාවෝචිත පරිදි, ඒ බලයලත් නිලධරයා විසින් හෝ අනුමත කළ විශ්ලේෂක විසින් එකී සොයාගැනීම ප්‍රධාන රේගු අයකැමි වෙත වාර්තා කළ යුතු අතර, එවිට ඒ ආහාර ද්‍රව්‍යය මනුෂ්‍ය ආහාරය සඳහා ශ්‍රී ලංකාවේ විකිණීමට මුදා හැරීම වළක්වාලීමට අවශ්‍ය වන පියවර ප්‍රධාන රේගු අයකැමි විසින් ගනු ලැබිය යුතු ය. ඒ පරීක්ෂාව කළ හෝ පරීක්ෂාව නැහොත් විශ්ලේෂණය සඳහා ඒ ආහාර සාම්පලය යැවූ බලයලත් නිලධරයා විසින් තම වාර්තාවේ පිටපතක් හෝ එකී අනුමත කළ විශ්ලේෂකගේ වාර්තාවේ පිටපතක් ඒ ද්‍රව්‍ය ආනයනය කළ ආනයනකරු වෙත යැවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් උල්ලංඝනය කිරීම යම් ආහාර ද්‍රව්‍යයක ලේබලයට අදාළ වන්නක් වන අවස්ථාවක දී, බලයලත් නිලධරයකුගේ අධීක්ෂණය යටතේ සහ පනතේ හෝ පනත යටතේ සාදන ලද නියෝගවල විධිවිධානවලට අනුකූලව, එකී ආහාර ද්‍රව්‍ය නැවත ලේබල් කිරීමෙන් පසු ඒවා විකිණීම සඳහා හෝ මනුෂ්‍ය ආහාරය සඳහා ශ්‍රී ලංකාවේ මුදා හැරීමට අවසර දෙනු ලැබිය යුතු ය.

(3) (2) වන ඡේදයේ සඳහන් නැවත ලේබල් කිරීම ප්‍රධාන රේගු අයකැමි විසින් නියම කරනු ලබන මාස තුනකට වඩා වැඩි නොවිය යුතු කාල පරිච්ඡේදයක් තුළ දී සතුටුදායක ලෙස සිදු නොකරනු ලැබූ අවස්ථාවක දී ඒ බව බලයලත් නිලධරයා විසින් ප්‍රධාන රේගු අයකැමි වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර, එවිට ඒ ආහාර ද්‍රව්‍යය විකිණීම හෝ මනුෂ්‍ය ආහාරය සඳහා ශ්‍රී ලංකාවේ මුදාලීම හෝ වැළැක්වීමට අවශ්‍ය පියවර ඒ ප්‍රධාන රේගු අයකැමි විසින් ගනු ලැබිය යුතු ය.

(4) ප්‍රධාන රේගු අයකැමි විසින් නිශ්චය කරනු ලබන මාස තුනකට වඩා වැඩි නොවිය යුතු කාල පරිච්ඡේදයක් තුළ දී ආනයනකරුගේ වියදමින් ඒ ඒ ආහාර ද්‍රව්‍ය නැවත අපනයනය කිරීමට හෝ විනාශ කිරීමට හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමට ඒ ආනයනකරුට අවස්ථාවක් රේගු අයකැමි විසින් ලබා දිය යුතු අතර, ඉන්පසු, මේ නියෝගවල ඉහතින් දැක්වුනු විධිවිධාන උල්ලංඝනය කරමින් ආනයනය කරනු ලද එකී ආහාර ද්‍රව්‍ය ප්‍රධාන රේගු අයකැමි විසින් නියම කරනු ලබන ආකාරයට, බලයලත් නිලධරයකුගේ අධීක්ෂණය යටතේ විනාශ කිරීමට හෝ බැහැර කිරීමට ප්‍රධාන රේගු අයකැමි විසින් කටයුතු යෙදිය යුතු ය. තව ද ඒ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම, විනාශ කිරීම හෝ බැහැර කිරීම සඳහා ප්‍රධාන රේගු අයකැමි විසින් දරන ලද වියදම් ප්‍රධාන රේගු අයකැමි වෙත ගෙවීමට ඒ ආනයනකරු යටත් විය යුතු ය"

(6) එහි උපලේඛනයෙහි 1 වන ආකෘති පත්‍රයේ (4) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(4) සාම්පලය (ක්ෂුද්‍ර ජෛවීය පරීක්ෂණය සඳහා ලබා ගන්නා ලද) ජීවාණුහරණය කරන ලද උපකරණ භාවිතා කර ලබා ගන්නා ලද බව සහ ජීවාණුහරණය කළ සහ ඉස්කුරුප්පු සහිත මූඩිවලින් වසන ලද බඳුන්වල නැතහොත් ජීවාණුහරණය කරන ලද වෙනත් බඳුන්වල ඒ සාම්පල බහාලන ලද බව.".

1985 ජූනි මස 7 වන දින අංක 385 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1984 ආහාර පනත (විවිධ) නියෝග ඉහත සඳහන් සංශෝධන සමඟ 1990 ඔක්තෝබර් මස 1 දා සිට ක්‍රියාත්මක විය යුතු ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.